මගේ අංකය - DL/E/21/17/LEO EB

ආයතන අංශය

කම්කරු දෙපාර්තමේන්තුව

කොළඹ 05

2022.03.29

ප්‍රධාන නීති නිලධාරී හා කම්කරු කොමසාරිස් (නීති ක්‍රියා / සේවය අවසන් කිරීමේ අංශය)

නියෝජ්‍ය කම්කරු කොමසාරිස්/කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් (බස්නාහිර -I, බස්නාහිර -II, බස්නාහිර - III, දකුණ, උතුර, මධ්‍යම, වයඹ, උතුරු මැද) වෙත,

**<u>කම්කරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී (විධායක සේවා ගණය III ශ්‍රේණිය) තනතුර සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022 - I</u>**

කම්කරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය (නීති නිලධාරි) තනතුර සඳහා 2013.02.15 දිනෙන් අනුමත නව බඳවා ගැනීමේ පරිපාටියට අනුව නීති නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03) ගතවීමට පෙර 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

02. ඒ අනුව නීති නිලධාරීන් සඳහා වන 2022 වසරට අදාළව පළමු වරට පැවැත්විය යුතු 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022 අප්‍රේල් මාසයේදී ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් පැවැත්වීමට සැලසුම් කර ඇත.

03. මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රයේ පිටපතක් මේ සමග අමුණා එවමි.

04. ඔබ අංශයේ/කලාපයේ සියළුම නීති නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි. ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ අංක 08 ඡේදයේ ඉල්ලුම්කරුගේ ආසන්නතම අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සඳහන් කර **2022.04.18** හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි.

05. මෙම පරීක්ෂණයට පළමුවරට ඉල්ලුම් කරන අපේක්ෂකයින්ගෙන් හැර අනෙකුත් සියළුම අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කරනු ලැබේ.

- එක් විෂයයක් සඳහා රු: 300/=
- එක් විෂයයකට වැඩි විෂයයන් ගණනක් සඳහා රු: 500/=

06. විභාග ගාස්තු ගෙවීම

6.1 **ප්‍රාදේශීය කාර්යාල/උප කාර්යාල වලට විභාග ගාස්තු ගෙවීමේදී:** අපේක්ෂකයා විසින් පොදු 118 ආකෘති පත්‍රයේ විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය **2003.02.99** ලෙස සටහන් කර මෙම නිවේදනයේ පිටපතක්ද සමග ඔබ කාර්යාලයේ මුදල් අයකැමි වෙත ඉදිරිපත් කළ යුතුය. එම මුදල් ලබාගැනීම වෙනුවෙන් නිකුත් කරනු ලබන රිසිට්පත (පොදු 172) ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටසේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

**6.2. ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත විභාග ගාස්තු ගෙවීමේදී:** අපේක්ෂකයා විසින් පොදු 118 ආකෘති පත්‍රයේ විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය : **2003.02.99** ලෙස සම්පූර්ණ කර භාර දී එම මුදල් ගෙවීම වෙනුවෙන් රිසිට් පතක් (පොදු 172) සරප් වෙතින් ලබා ගත යුතුය.

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්

නීතිඥ බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05

පිටපත්: 01. ලේකම්, කම්කරු අමාත්‍යාංශය

02. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

03. සියලුම කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්,
දිස්ත්‍රික් කම්කරු කාර්යාල භාර සහකාර කම්කරු කොමසාරිස්වරුන්,
කම්කරු කාර්යාල භාර ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන් } විභාග ගාස්තු අය කර ගැනීමේ කටයුතු සඳහා

කම්කරු දෙපාර්තමේන්තුව

**නීති නිලධාරී (විධායක සේවා ගණය III ශ්‍රේණිය) තනතුර සඳහා වන**

**1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022 - I**

නීති නිලධාරී (විධායක සේවා ගණය III ශ්‍රේණිය) තනතුර සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය කම්කරු කොමසාරිස් ජනරාල් විසින් 2022 අප්‍රේල් මාසයේදී ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් පැවැත්වීමට සැලසුම් කර ඇත.

01. විභාග පරිපාටිය

1.1 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා)

1.1.1 විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. කම්කරු නීති I | පැය 03 යි | 100 | 40 |
| 02. සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය | පැය 03 යි | 100 | 40 |

1.1.2 විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01.කම්කරු නීති I | 1. දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින සියලුම කම්කරු අණපනත් රෙගුලාසි සහිතව.<br>2. මුල් අවස්ථා අධිකරණවල (Courts of first instance) බලතල හා කාර්ය භාරය<br>3. අපරාධ නඩු විධාන සංග්‍රහය / සාක්ෂි ආඥා පනත.<br>4. අර්ථ නිරූපන ආඥා පනත.<br>5. මුල් අවස්ථා අධිකරණ වල චෝදනා පත්‍ර, පැමිණිලි පත්‍ර සහ දිවුරුම් පෙත්සම් සකස් කිරීම, ගොනු කිරීම සහ අභියෝගයට ලක් කිරීම.<br>6. ශ්‍රී ලංකාවේ කම්කරු අණ පනත් වලට අදාළව ලබාදී ඇති නඩු තීන්දු. |
| 02. සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය | 1. ආයතන සංග්‍රහයේ II,III,IV,VII,XII,XIX,XLVIIහා XLVIIIපරිච්ඡේද හය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ III,IV, VI, VII, VIII,IX, X හාXIපරිච්ඡේද<br>3. මුදල් රෙගුලාසි සංග්‍රහයේIV, හා VIපරිච්ඡේද සහ 124, 125, 127, 128, 135, 136, 137, 138 දරණ මුදල් රෙගුලාසි |

**02 අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

මෙම පරීක්ෂණයට පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂයින් මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව A4 කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින්අංක 01 සිට 05 දක්වා ඡේද එක් පිටුවකටත්, ඉතිරි කොටස අනෙක් පිටුවටත් වන සේ සකසා ගත් අයදුම්පත් අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතව **2022.04.18** දින හෝ ඊට **ප්‍රථම කම්කරු කොමසාරිස් ජනරාල්** වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **"**නීති නිලධාරී (විධායක සේවා ගණය III ශ්‍රේණිය) තනතුර **සඳහා** වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022-I **"** යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03.** **විභාග ගාස්තු :**

මෙම පරීක්ෂණයට පළමුවරට ඉල්ලුම් කරන අපේක්ෂකයින්ගෙන් හැර අනෙකුත් සියලුම අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කරනු ලැබේ.

- එක් විෂයයක් සඳහා රුපියල් 300/=
- එක් විෂයයට වැඩි විෂයයන් ගණනක් සඳහා රුපියල් 500/=

**04.** **විභාග ගාස්තු ගෙවීම :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර මෙම විභාග ගාස්තු කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත හෝ කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල/උප කාර්යාලවල මුදල් අයකැමි වෙත ගෙවා ලබාගත් ලදුපත ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටසේ අලවා එවිය යුතුය.

සැ.යු. <u>ප්‍රධාන කාර්යාලයට/ ප්‍රාදේශීය/උප කාර්යාලවලට විභාග ගාස්තු ගෙවනු ලබන අපේක්ෂකයින්</u> **- ලදුපත ලබා ගැනීමේදී සම්පූර්ණ කළයුතු පොදු 118 ආකෘති පත්‍රයේ විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය 2003.02.99 ලෙස සඳහන් කරන්න.**

**(මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)**

| |
|---|
| සටහන : විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය. |

**05.** **විභාගයට පෙනී සිටීමට සුදුසුකම් :**

මෙම නිවේදනය සැලකිල්ලෙන් කියවා ඉල්ලා ඇති සියලුම තොරතුරු සම්පූර්ණ කර, අයදුම්පත් නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**06.** **විභාගයට ඇතුළත් කර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා තිබෙන සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් නිකුත් කරනු ලැබේ.

07. විභාගයට පෙනී සිටීම සඳහා පැමිණීම වෙනුවෙන් ගමන් වියදම්, සංයුක්ත දීමනා හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්

නිරිංගු බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05

දිනය: 2022.03. 27

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

## කම්කරු දෙපාර්තමේන්තුව

## නීති නිලධාරී (විධායක සේවා ගණය III ශ්‍රේණිය) තනතුර සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022 - I

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : (ඉංග්‍රීසියෙන්) ....................................................................

.................................................................................................................

1.2 සම්පූර්ණ නම : (ඉංග්‍රීසියෙන්)....................................................................

.................................................................................................................

1.3 අයදුම්කරුගේ මුලකුරු සමග නම : (සිංහලෙන්) ....................................................................

.................................................................................................................

1.4 සම්පූර්ණ නම : (සිංහලෙන්) ....................................................................

.................................................................................................................

02. 2.1 තනතුර : ....................................................................

03 3.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසියෙන්)....................................................................

.................................................................................................................

3.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : (සිංහලෙන්)....................................................................

.................................................................................................................

3.3 රාජකාරී ස්ථානය හා එහි ලිපිනය : (ඉංග්‍රීසියෙන්) ....................................................................

.................................................................................................................

3.4 රාජකාරී ස්ථානය හා එහි ලිපිනය : (සිංහලෙන්)....................................................................

.................................................................................................................

3.5 දුරකථන අංක : රාජකාරී : [ ] පුද්ගලික : [ ]

04. 4.1 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

4.2 උපන් දිනය :

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

4.3 ස්ත්‍රී පුරුෂ භාවය [ ]

05. 5.1 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]

5.2 පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයය/විෂයයන් :

| | |
|---|---|
| | |
| | |
| | |

06. 6.1 ඔබ මෙම පරීක්ෂණයට ඉල්ලුම් කරනුයේ පළමු වරට ද?

6.2 ඉහත 6.1 ට පිළිතුර "නැත" නම් නිවේදනයේ 03 ඡේදයට අනුව විභාග ගාස්තු ගෙවන ලද බැංකු ශාඛාවේ නම : ..........................................................................................

6.3 මුදල් ගෙවන ලද කුවිතාන්සියේ අංකය හා දිනය : ..........................................................
..........................................................................................................................

| |
|---|
| (මුදල් ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ එක් කෙළවරකින් මෙහි අලවන්න. එහි ඡායා පිටපතක් ඔබ ළග තබා ගන්න.) |

07. අයදුම්කරුගේ ප්‍රකාශය :

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

(ආ) මෙම විභාගයට අදාළ සියලු ම කොන්දේසි පිළිපැදීමට මම එකඟ වෙමි.

දිනය : අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන

**08 කාර්යාල/අංශ ප්‍රධානියාගේ නිර්දේශය :**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ඉහත අත්සන යෙදූ නිලධාරියා/නිලධාරිනිය මෙම කාර්යාලයේ/අංශයේ සේවය කරන බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය : කාර්යාල/අංශ ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව

**09 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :**

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

දිනය : දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව